ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# University of Sri Jayewardenepura

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

# External Degrees and Extension Courses Unit

## බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන්ට ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිසීමේ පහසුකම ලබාදීම

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය සහ සිසුන් අතර අන්තර්සම්බන්ධතා වඩාත් කාර්යක්ෂම කිරීමට සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මඟින් සිසුන් වෙත තොරතුරු සන්නිවේදනය පහසුකිරීමේ අරමුණෙන් 2015 අධ්‍යයන වර්ෂයේ සිට බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන්ට පහත සියලුම කාර්යයන් ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) මඟින් සිදුකර ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී.

- පෞද්ගලික තොරතුරු යාවත්කාලීන කිරීම. (ලිපිනය සහ දුරකථන අංකය)
- පාඨමාලා ගාස්තු වාරික ගෙවීම.
- පරීක්ෂණ සඳහා අයදුම් කිරීම.
- විභාග ප්‍රවේශ පත්‍ර බාගත (download) කර ගැනීම.
- පරීක්ෂණ ප්‍රතිඵල ලේඛන ලබා ගැනීම.
- ප්‍රතිඵල නැවත සමීක්ෂණ අයදුම්පත් යොමුකිරීම.
- ලියාපදිංචිය දීර්ඝ කිරීමේ අයදුම්පත් යොමුකිරීම.

මෙය අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත.

<u>අදියර 1</u>

අදියර 1 යටතේ සිසුන් විසින් 2025/08/20 දිනට පෙර ස්වයංව ඔබගේ ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) සකස් කරගත යුතුය. ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) සකස් කරගන්නා ආකාරය සහ ඊට අදාළ වීඩියෝවක් මෙහි පළකර ඇත. ඒ අනුව ඔබට ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) සකස් කරගැනීමේදී යම් ගැටළුවක් ඇති වුවහොත් ඒ බව පහත තොරතුරු ඇතුලත් කර reg.edecu@sjp.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

- ලියාපදිංචි වී සිටින උපාධි පාඨමාලාව
- ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම
- ලියාපදිංචි අංකය
- ජාතික හැඳුනුම්පත් අංකය
- ශිෂ්‍ය තොරතුරු ගොනුවට ප්‍රවේශ වීමේදී ඇතිවන ගැටළුව (screenshot)
- දුරකථන අංකය
- විද්‍යුත් තැපැල් ලිපිනය

අදියර 2

අදියර 2 යටතේ ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) පිළිබඳව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව පහත දක්වා ඇති පරිදි ඔබට නියමිත දින ඔබට නියමිත වේලාවට Zoom තාක්ෂණය ඔස්සේ එම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්බන්ධ වන ලෙස දන්වා සිටිමි. අදාළ දිනයේදී මෙහි පළකරනු ලබන දිගුව වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය යෙදීමෙන් ඔබට අදාළ Zoom link ලබා ගත හැකිය.



ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025.07.29